# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1652/51 - 2010 මැයි 06 වැනි බ්‍රහස්පතින්දා - 2010.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

1990 අංක 04 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

1990 අංක 04 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වැනි වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාතර දිස්ත්‍රික්කයේ මාතර මහා නගර සභාවේ නගරාධිපති වන සුභාවික්‍රම මල්ලිකා විදානාච්චිගේ උපුල් නිශාන්ත මහතා මාතර මහා නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කිරීමේදී මහා නගර සභා ආඥාපනතේ 277 වගන්තිය සහ 1990 අංක 04 දරන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු වන එදිරිමුණි සමිත් ද සිල්වා මහතා පත් කර ඇත.

02. තවද, දකුණු පළාතේ පළාත් සභාවේ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා වන මා 1990 අංක 04 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 (1ආ) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාතර දිස්ත්‍රික්කයේ මාතර මහා නගර සභාවේ නගරාධිපති වන සුභාවික්‍රම මල්ලිකා විදානාච්චිගේ උපුල් නිශාන්ත මහතා එකී මහා නගර සභාවේ නගරාධිපති ධුරයේ කටයුතු කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ.

03. තවද, 1990 අංක 04 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277 (1 ආ) (i) වගන්තිය යටතේ මාතර මහා නගර සභාවේ නගරාධිපති ධුරයේ කටයුතු කළ සුභාවික්‍රම මල්ලිකා විදානාච්චිගේ උපුල් නිශාන්ත මහතා එම ධුරයේ කටයුතු කිරීම වහාම අත්හිටුවා ඇති හෙයින් ඔහුගේ

බලතල ක්‍රියාත්මක කිරීමටත් කාර්ය ඉටුකිරීමටත් 1990 අංක 04 දරන දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තියේ 3(අ)(1) වගන්තිය සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 277(1 ආ) (i) වගන්තිය අනුව මාතර මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධූරයේ කටයුතු කරන දීගොඩ ගමගේ යසරත්න මහතාට විධාන කරනු ලැබේ.

ෂාන් විජයලාල් ද සිල්වා,
මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා
ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
දකුණු පළාත.

2010 මැයි මස 06 වැනි දින.

05-481

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.